# කුරුලු පරපුරේ මිතුන්මිත්තෝ ඩයිනොසෝරයෝ ද ?



නූතන කුරුලු පරපුරේ
සැබෑ මිතුන්මිත්තෝ
ඩයිනොසෝරයෝ ද?
සුවිශේෂී අනාවරණ දෙකක්
මඟින් එම මතය තව දුරටත්
සනාථ වෙමින් පවතී.

**කුරැල්ලන් ගේ විකසනය, කෙළින් ම ඩයිනොසෝරයන්ගෙන් සිදුවූ බවට වූ අදහස පළ වූයේ මෑත වකවානුවේ දී ය. බැලූ බැල්මට පෙනී යන්නේ එය ඇදහිය නොහැකි මතයක් ලෙසට ය. එහෙත්, ඩයිනොසෝරයන් හා කුරුල්ලන් සහතික ලෙසම එක හා සමාන ශරීර ව්‍යුහයන්ට උරුමකම් කී බවට, ශතවර්ෂයකටත් අධික කාලයක් මුළුල්ලේ, පොසිල විද්‍යාඥයන් දැන සිටි මුත්, එය තහවුරු කර නිවැරදි සබඳතාව පෙන්වීමට ඔවුහු අපොහොසත් වූහ.**

කෙසේ හෝ ගතවූ දශක දෙකක කාලය පුරා, කුරුල්ලන්ට හා ඩයිනොසෝරයන්ට නෛසර්ගික වශයෙන් පොදු වූ කරුණු පිළිබඳ අනාවරණය කර ගැනීමට විද්‍යාඥයෝ සමත් වූහ.

බෙල්ල හා පපුව අතර වූ කරු ඇටය, කරකැවෙන මැණික් කටු අස්ථිය සහ ඉතාමත් මෑතක දී අනාවරණය වූ පරිදි ඇතැම් ඩයිනොසෝරයන්ගේ ශරීරය පිහාටුවලින් ආවරණීත වීම දෙපිරිසටම පොදු වූ ශාරීරික ලක්ෂණයන් විය.

මෙහි දී හැසිරීම් රටාව හා සැබැඳුණු සාක්ෂි ද හමු විණි. ඇතැම් ඩයිනොසෝරයෝ කූඩු තැනූ අතර, එහි ලැග සිටියහ.

පියාපත් හතරකින් යුතු එක්තරා ඩයිනොසෝරයෙක් පෙනුමෙන් හරියටම පියාඹන ලේනකු මෙන් දිස් වී ඇත. මේ අනුව, උද්‍යානයේ ඔබ නෙතට හසුවන පරෙවියන්ට, පොළොව පාලනය කළ පූර්වජයෙක් සිටි බවට, නවතම සොයා ගැනීම් මඟින් වඩාත් තහවුරු වී තිබේ. පසුගියද නේචර් සඟරාවට ලියමින්, චීන සහ ඇමරිකානු පොසිල විද්‍යාඥයන් ප්‍රකාශයට පත් කළේ, නිද සිටින තාරාවකු ගේ ස්වරූපයෙන්, වකුටවී සිටි එක්තරා ඩයිනොසෝර පොසිලයක් සහ මෙතෙක් හමුවූ ප්‍රථම පිහාටු සහිත ටයිරානොසෝරස පොසිලයක් පිළිබඳ ය.

ඩයිනොසෝර පවුල, නූතන කුරුල්ලන්ගේ සමීපතම ඥතීන් අතර සිටින බවට වූ විශ්වාසය නිසා, ටයිරානොසෝරසයන් පිළිබඳ එම සොයා ගැනීම සුවිශේෂී සිදුවීමක් වනු ඇත.

මේ අතර, වෙනත් කණ්ඩායමක් විසින් සිදු කරනු ලැබූ විශ්ලේෂණයක් මඟින් පෙන්වා දුන්නේ,

## පොසිල පාරාදීසය

**චීනයේ "බේපියෝ"** (Bapio) **නගරය ආසන්නයේ වූ ලියාඕනිං ප්‍රාන්තයේ නව පොසිල නිදර්ශක හමු වූ ප්‍රදේශය, අද ඉතා වටිනා පොසිල තැන්පතු හමු වන ප්‍රදේශයක් බවට පත්ව තිබේ.**



